2022 . 02 . 04 අරුණ

පිටුව 1 , 2.

# කොවිඩ් මුල් රැල්ලෙන් 7%කට රැකියා අහිමිවේ

නයන තරංග ගමගේ

කොවිඩ් පළමු රැල්ලෙන් ශ්‍රී ලංකාවේ සියයට 7කට රැකියා අහිමිවී ඇති බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව එළිදක්වන ලද නවතම සමීක්ෂණ වාර්තාවකින් අනාවරණය වේ.

02 පිටුවට

## කොවිඩ් මුල් රැල්ලෙන්...

2020 වර්ෂයේ කොවිඩ් පළමු රැල්ල මෙරට වැඩ කරන ජනතාවට සිදුකරන ලද බලපෑම එම වාර්තාව මගින් නිරීක්ෂණය කර ඇත. එම වාර්තාවට අනුව වැටුප් ලබන සේවකයන්ගෙන් සියයට 7කට සම්පූර්ණයෙන්ම ඔවුන්ගේ රැකියා අහිමිව ගිය බව කියැවේ.

මේ අතර කෘෂි අංශයේ ස්වයං රැකියාවන් හි නිරතවන්නන්ගෙන් 64.3% ක් සාමාන්‍ය පරිදි ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වුවද 14.6% ක් පවසා ඇත්තේ ඔවුන්ගේ නිෂ්පාදිත සාමාන්‍ය පරිදි අලෙවි කර ගැනීමට නොහැකි වී ඇති බවයි. කෘෂි නොවන ස්වයං රැකියාවන් හි නිරතවන්නන්ගෙන් 92.9%ක් ම පවසන්නේ ඔවුන්ගේ ආදායම් මාර්ග පෙර පැවති මට්ටමට වඩා පහළ ගිය බව හෝ සම්පූර්ණයෙන්ම නැවතී ඇති බවයි.

මෙම වාර්තාව මගින් වැඩිදුරටත් අනාවරණය කර තිබූ ආකාරයට වැටුප් ලබන සේවක කාණ්ඩයේ 26.5% ක සේවක සංඛ්‍යාවක් 2020 මාර්තු 20 දිනෙන් පසු සාමාන්‍ය පැය ගණනට වඩා අඩු ප්‍රමාණයක් සේවයට වාර්තා කර ඇත. එසේම ශ්‍රී ලංකාව කොවිඩ් වසංගතයේ පළමු රැල්ලට ගොදුරු වූ අවස්ථාවේ දී ලොක්ඩවුන් කාලසීමාව ඇතුළත සමස්ත වැටුප් ලබන සේවක සංඛ්‍යාවෙන් 45% ක් වැටුප් සහිතව සේවයට වාර්තා කර නොමැත.